සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සහ එහි පරිපාලිතයන් - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදි. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම සහ සමූහය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම සහ සමූහය කටයුතු කර ඇති බව,
- සමාගමේ සහ සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තොග පිළිබඳ එල්.කේ.ඒ.එස් 02 ප්‍රමිතියේ 11 වන ඡේදයට අනුව, තොග මිලදී ගැනීමේ පිරිවැයට මිලදී ගැනීමේ මිල, ආනයන බදු හා අනෙකුත් බදු සහ නිමි භාණ්ඩ, ද්‍රව්‍ය සහ සේවා අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි ප්‍රවාහන, පරිහරණ සහ අනෙකුත් වියදම් ඇතුළත් වේ. කෙසේ වෙතත්, සමාගම විසින් එකතු කරන ලද සුන්බුන් ඇලුමිනියම් කිලෝග්‍රෑම් 3,510,914 ක් මිලදී ගැනීමේ පිරිවැය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.	ලංකා විදුලිබල මණ්ඩලයේ සුන්බුන් ඇලුමිනියම්, ඇලුමිනියම් re-draw roads (ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ සැකසූ නිෂ්පාදනය) ලෙස ලං.වි.ම වෙත නැවත එම ප්‍රමාණයම භාර දීමේ පදනම මත ද්‍රව්‍ය සඳහා කිසිදු පිරිවැයක් අය කිරීමෙන් තොරව ශ්‍රී ලංකා එනර්ජීස් වෙත භාර දෙන ලදි. සුන්බුන් ඇලුමිනියම්වල වටිනාකම සඳහා නිසි පදනමක් හඳුනාගත් පසු එකතු කරන ලද ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ආ)	එල්.කේ.ඒ.එස් 08 හි 42 වන ඡේදයේ (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි) විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීම් සිදු කිරීමෙන් තොරව, පසුගිය වර්ෂයට අදාළව රු.2,051,756 ක් වූ වියදම් කාණ්ඩ දහයක් (10) 2024 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂය සඳහා ලාභය රු.2,051,756 කින් අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ වේ. අනාගතයේදී මෙය අවම කිරීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන ඡේදයට අනුව, වත්කමක සුන්බුන් වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම්, වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට කාණ්ඩ 7 කට අදාළව රු. 56,231,603 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම් සමාලෝචනය කර ප්‍රමිතීන්ට අනුව ගිණුම්ගත කර නොතිබුණි.	අනාගතයේදී වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඈ)	සමාගම රු. මිලියන 135 ක ණය පහසුකමක් ලබාගෙන තිබූ අතර එය 2024 වර්ෂයේදී ඉහත ණය පහසුකම වෙනුවෙන් රු. මිලිනය 72 ක මුදල් ශේෂයන් සහ රු. මිලියන 62 ක ස්ථාවර තැන්පතුවලින් සුරක්ෂිත කර තිබුණි. සුන්බුන් ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය කිරීම සඳහා සමාගම ඉහත ණය පහසුකමෙන් රු. මිලියන 84 ක් භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම පිළිබඳ එස්.එල්.එෆ්.ආර්.එස් 07 ප්‍රමිතියෙහි 14 වන ඡේදයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත ණයෙහි සුරැකුම් කොන්දේසි විස්තරාත්මකව හෙළිදරව් කර නොතිබුණි.	සම්පත් බැංකුවේ පිරිනැමීමේ ලිපියට අනුව ආනයන ණය පහසුකම පහත සඳහන් සුරැකුම් කොන්දේසි යටතේ පවතින අතර ඒ අනුව ඉදිරියේදී හෙළිදරව් කරනු ඇත. "රු. 72,126,259.34 ක් සඳහා ස්ථාවර තැන්පතු අංක 206118600516 හි ඇති අරමුදල් සහ රු. 62,837,740.66 ක් සඳහා ඉතිරි කිරීමේ ගිණුම් අංක 106114005271 හි ඇති අරමුදල් උගස් කර ඇත."	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඉ)	සමාගම විසින් 2017 ජූලි 07 වන දින සිට වර්ෂ 35 ක කාලයක් සඳහා ගලිගමුව ඉඩම සඳහා කල්බදු ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, කල්බදු පිළිබඳව එස්.එල්.එෆ්.ආර්.එස් 16 ප්‍රමිතිය ප්‍රකාරව එම කල්බදු ගිවිසුමට අදාළ භාවිත අයිතිය සහිත වත්කම සහ කල්බදු වගකීම සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.	එකඟ වේ. අනාගතයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඊ)	සේවක ප්‍රතිලාභ පිළිබඳ එල්.කේ.ඒ.එස් 19 ප්‍රමිතියේ 59 වන ඡේදයට අනුව සියලුම සැලකිය යුතු පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳීම් මැනීමේදී ආයුගණක තක්සේරුකරණ ක්‍රමය යොදා ගැනීමට දිරිමත් කරනු ලැබුවද, එහි විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මැනීමේදී එවැනි පරිචයක් යොදාගෙන නොතිබුණි.	ඒ අනුව ආයුගණක තක්සේරුවට අනුකූල වනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(උ)	විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම්වල බලපෑම් පිළිබඳ එල්.කේ.ඒ.එස් 21 ප්‍රමිතියේ 23(අ) ඡේදයට අනුව, එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ විදේශ විනිමය මුදල්මය අයිතම, අවසාන විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට එ.ජ.ඩො 751,484 (හේලීස් ඇවෙන්චුරා ප්‍රයිවට් ලිමිටඩ්) ක වෙළඳ ණයහිමියාගේ ශේෂය, අවසාන විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත වෙළඳ ණයහිමියාගේ ශේෂය මත විදේශ විනිමය ලාභය රු. 9,716,020 කින් අඩුවෙන් දක්වා තිබූ අතර වෙළඳ ණයහිමියන්ගේ ශේෂය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 වන දිනට ඉහත ණයහිමියාගේ ශේෂය, අවසාන විනිමය අනුපාතය භාවිතයෙන් පරිවර්තනය කර නොතිබුණි. එබැවින්, රු. 5,814,214 ක් වූ විදේශ විනිමය ලාභය එල්.කේ.ඒ.එස් 08 ප්‍රමිතියට අනුව ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රඳවා ගත් ඉපැයීම් එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ වේ. අනාගතයේදී එල්.කේ.ඒ.එස් 21 ප්‍රමිතියට අනුකූලව හොඳම පරිචය අනුගමනය කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඌ)	ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් පිළිබඳ එල්.කේ.ඒ.එස් 37 ප්‍රමිතියේ 86 වන ඡේදයට අනුව, පියවීමේදී කිසියම් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ නොවේ නම්, ආයතනයක් විසින් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ එක් එක් අසම්භාව්‍ය වගකීම් පන්තිය සඳහා අසම්භාව්‍ය වගකීම්වල ස්වභාවය පිළිබඳ කෙටි විස්තරයක් සහ ප්‍රායෝගිකව කළ හැකි නම්, 36-52 ඡේද යටතේ මනිනු ලබන එහි මූල්‍ය බලපෑම පිළිබඳ ඇස්තමේන්තුවක්, වටිනාකමට අදාළ අවිනිශ්චිතතාවයන් හෝ කිසියම් ප්‍රතිපූරණය හැකියාව පිළිබඳ ඇඟවීමක් හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගමට එරෙහිව ගොනු කර ඇති නඩුව පිළිබඳව සමාගම විසින් හෙළිදරව් කර නොතිබුණි.	නීතිමය ක්‍රියාමාර්ගය (නඩු අංකය: 42/KE/08/2022 - ඩී.එම්.සී දිසානායක) සමාගමේ හිටපු සේවකයා විසින් ගොනු කරන ලද නඩුවට යොමු වන අතර එය දැනට කෑගල්ල කම්කරු අධිකරණය යටතේ විභාග වෙමින් පවතී. අනාගතයේදී අසම්භාව්‍ය වගකීම් යටතේ හෙළිදරව් කිරීමට පියවර ගනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය (සුන්බුන් ඇලුමිනියම් නොමැතිව) රු.55,376,984 ක් විය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දින පවත්වන ලද භෞතික තොග සත්‍යාපනයට අනුව, තොගවල මුළු ශේෂය රු.54,190,884 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු.1,186,100 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, 2024 දෙසැම්බර් 31 දිනට තොග ශේෂයන් සැසඳීමට සමාගම කටයුතු කර නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන සහ 2024.12.31 දින සිදු කරන ලද සත්‍යාපනය (විගණන භෞතික සත්‍යාපනය දිනය) අනුව තොග ශේෂය සැසඳීම. ඒ අනුව, කලින් විගණනයට දන්වා ඇති පරිදි, වාර්තා දෙක අතර ප්‍රමාණවල කිසිදු වෙනසක් නොතිබුණි. නමුත් ඊ.ආර්.පී පද්ධතිය බරිත සාමාන්‍ය පිරිවැය මොඩියුලය අනුගමනය කරන බැවින් තත්‍ය කාලීන තොග තක්සේරුව පමණක් වෙනස් වී ඇත.	අවසන් තොග සැසඳීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු රු. මිලියන 30.77 ක් වූ අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද ආදායම් බදු වාර්තාවලට අනුව (2020/2021 තක්සේරු වර්ෂය දක්වා), එම කාලපරිච්ඡේදයට අදාළව ගෙවිය යුතු ආදායම් බදු රු. මිලියන 15.2 ක් විය. ඒ අනුව, රු. මිලියන 15.57 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි.	වාර්ෂික වාර්තා ගොනු කිරීම සහ ගෙවීම් තත්ත්වය පිළිබඳ සාරාංශය පහත පරිදි වේ. • 2015/2016-2017/2018 ගෙවා ඇත. • 2019/2020-2023/2024 ගෙවා නොමැත. ආයතනික ආදායම් බදු ගොනු කිරීම සම්පූර්ණ කිරීමට පෙර, අදාළ කාලපරිච්ඡේදයට අදාළ වන බදු අනුපාතය යොදා ගනිමින් සිදු කරන ලද ආදායම් බදු ප්‍රතිපාදනය මත පදනම්ව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කරන ලදී. ඒ අනුව, මූල්‍ය වාර්තා අනුව ශේෂය, සමුච්චිත ආයතනික ආදායම් බදු වාර්ෂික වාර්තා අගය සමඟ සංසන්දනය කරන විට වෙනසක් හඳුනා ගෙන ඇත. මෙම වෙනස ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරනු ඇත. හැකි ඉක්මනින් පියවීම සඳහා කටයුතු කර ඇත.	ගෙවිය යුතු ආදායම් බදු සැසඳීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් බදු රු.88,715,153 ක් වූ අතර 2022/2023 සහ 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය පිළිවෙලින් රු.3,457,708 ක් සහ රු.44,830,141 ක් විය. කෙසේ වෙතත්, එම තක්සේරු වර්ෂ සඳහා තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී, වත්කම් සඳහා ප්‍රාග්ධන දීමනා ගණනය කිරීමේදී පිළිවෙලින් රු.100,596,911 ක් සහ රු.20,584,015 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සලකා බලා තිබුණු අතර සියයට 30 වෙනුවට සියයට 24 ක අනුපාතයක් යොදා ගෙන තිබුණි. තවද,		

විගණනය මගින් සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව, 2022/2023 සහ 2023/2024 තක්සේරු වර්ෂයන් සඳහා ගෙවිය යුතු ආදායම් බදු පිළිවෙලින් රු.2,652,495 ක් සහ රු.59,278,174 ක් විය. ඒ අනුව, එම තක්සේරු වර්ෂයන් සඳහා රු.13,642,820 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය කරන ලද අතර, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ ගෙවිය යුතු ආදායම් බදු රු.13,642,820 කින් අඩුවෙන් දක්වා තිබුණි.		
(ඇ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 වන විට ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය රු.8,788,579 ක් විය. කෙසේ වෙතත්, බදු ගණනය කිරීමේ පත්‍රිකාවට අනුව, 2024/2025 තක්සේරු වර්ෂය සඳහා එය රු.12,874,877 ක් විය. ඒ අනුව, රු.4,086,298 ක වෙනසක් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය 2024 වර්ෂයේදී එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	ආයතනික ආදායම් බදු ගොනු කිරීම සම්පූර්ණ කිරීමට පෙර, අදාළ කාලපරිච්ඡේදයට අදාළ වන බදු අනුපාතය යොදා ගනිමින් සිදු කරන ලද ආදායම් බදු ප්‍රතිපාදනය මත පදනම්ව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කරන ලදි. ඒ අනුව, මූල්‍ය වාර්තා අනුව ශේෂය, සමුච්චිත ආයතනික ආදායම් බදු වාර්ෂික වාර්තා අගය සමඟ සංසන්දනය කරන විට වෙනසක් හඳුනා ගෙන ඇත. මෙම වෙනස ඉදිරි වර්ෂයෙදී ගැලපීම් කරනු ඇත.	ගෙවිය යුතු ආදායම් බදු සැසඳීමට කටයුතු කළ යුතුය.

1.5.1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, පරිපාලිත සමාගමක් වන කුඹල්ගමුව කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගමේ ආයෝජනයට අදාළව 2017 වර්ෂයට පෙර සිදු කරන ලද හානිකරණය සඳහා ප්‍රතිපාදනය රු. 10,719,147 ක් විය. කෙසේ වෙතත්, හානිකරණය සඳහා ප්‍රතිපාදනයට අදාළ ජර්නල් වවුචර්, තක්සේරු වාර්තාව සහ අනෙකුත් අදාළ ලේඛන විගණනය සඳහා ලබා දී නොතිබුණි.	2017 වර්ෂය සඳහා වර්ෂය අවසාන විගණනයේදී බාහිර විගණක (අර්නස්ට් සහ යන්ග්) විසින් යෝජනා කරන ලද ජර්නල් සටහන හරහා රු. 10,719,147.00 ක හානිකරණය සඳහා මෙම ප්‍රතිපාදනය සිදු කරන ලද අතර වාර්ෂික විගණනය අවසන් කිරීම සඳහා ලද ජර්නල් සටහන් ලැයිස්තුව හැර වෙනත් සාක්ෂි හඳුනාගත නොහැක.	එක් එක් ජර්නල් සටහන් සඳහා ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය.

1.5.1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවිය යුතු ආදායම් බදුවලට එරෙහිව වසර නවයකට වැඩි කාලයක සිට රු. 10,152,100 ක් වූ ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය සමාගම විසින් හිමිකම් පා නොතිබුණි. එබැවින්, රඳවා ගැනීමේ බදු ශේෂයේ අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වේ.	බැංකුවෙන් රඳවා ගැනීමේ බදු සහතික ඉල්ලා ඇති අතර මෙය ඉක්මනින් අවසන් කිරීමට සැලසුම් කර ඇත.	හැකිතාක් දුරට ශේෂයන් අයකර ගැනීමට සහ දිගුකාලීන හිඟ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතු ශේෂය රු. 2,425,643 ක් වූ අතර නිරවුල් කිරීමෙන් තොරව 2019 වර්ෂයේ සිට මෙම ශේෂය එකතු වී ඇත.	විගණනයට ඉදිරිපත් කරන ලද පරිදි, හඳුනා නොගත් තැන්පතු ශේෂයන්ගෙන් වැඩි ප්‍රමාණයක් 2024 වර්ෂයේදී විසඳා ඒ අනුව නිවැරදි කරන ලද අතර එක් සටහනක් පමණක් ඉතිරිව ඇත. මෙය හඳුනා ගැනීමට කටයුතු කරනු ඇත.	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	වියදම් කාණ්ඩ හයකට අදාළව රු. 490,144 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය වැඩියෙන් දක්වා තිබූ අතර උපචිත වියදම් එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය වාර්තා අවසන් කිරීමෙන් පසු ව්‍යාපෘති අරමුදල් ප්‍රතිපූරණයට අනුකූලව මෙම වියදම් හඳුනාගෙන ඇති අතර මෙම වැරදි වාර්තා අවම කිරීම සඳහා පියවර ගෙන ඇත.	මූල්‍ය සංඛ්‍යාලේඛනවල සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා උපචිත වියදම් හඳුනා ගැනීමට සහ වාර්තා කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

පහත සඳහන් නිරීක්ෂණ මත පදනම්ව, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ මතයන් මා විසින් ප්‍රකාශ කරන ලදි.

1.5.2.1 සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයක් විසින් වැරදි සොයා ගැනීමෙන් පසු නිකුත් කිරීම සඳහා අවසර දී ඇති පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ප්‍රමාණාත්මක පෙර කාල පරිච්ඡේද වැරදි, (අ) වැරැද්ද සිදු වූ පෙර කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක වටිනාකම නැවත ප්‍රකාශ කිරීම; හෝ (ආ) ඉදිරිපත් කරන ලද මුල්ම පෙර කාල පරිච්ඡේදයට පෙර වැරැද්ද සිදු වූයේ නම්, ඉදිරිපත් කරන ලද මුල්ම පෙර කාල පරිච්ඡේදයේ වත්කම්, වගකීම් සහ ස්කන්ධවල ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කළ යුතු බව එල්.කේ.ඒ.එස් 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියේ 42 (ඒ) සහ (බී) ඡේදවල සඳහන් වේ. කෙසේ වෙතත්, 2023 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ලබා නොගත් උපදේශන සේවාවක් සඳහා සමාගම විසින් රු. 749,275 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. පසුව, මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීම් සිදු කිරීමෙන් තොරව ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව සමාගම විසින් 2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල ඉහත මුදල වෙනත් ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	අදාළ කාල සීමාව සඳහා ලබා දී ඇති කොන්ත්‍රාත් රැකියාව මත පදනම්ව කොන්ත්‍රාත් සේවකයාගේ මාසික වැටුප උපචිත පදනම යටතේ හඳුනා ගෙන ඇත. ඒ අනුව, 2024 වර්ෂයේදී එවැනි හඳුනාගැනීමක කිසිදු වැරැද්දක් නොතිබුණි. සේවාව ලබා නොගැනීම තහවුරු කර ගැනීම මත පදනම්ව ගැලපීම සිදු කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගම විසින් විකුණුම් පිරිවැය ගිණුමේ බාහිරෙන් ලබාගත් සේවකයින්ගේ වැටුප් සහ දීමනා හඳුනා ගෙන තිබුනද ඉහත වැටුප මත රු. 875,835 ක් වූ ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගිණුම් පොත්වල හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂය අවසානයේ ගෙවිය යුතු APIT එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	මෙය ඒ අනුව ගැලපීම් කරනු ඇත.	මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු APIT හඳුනාගත යුතුය.

1.5.2.2 සීමාසහිත කුඹල්ගමුව කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එල්.කේ.ඒ.එස් 08 හි (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි) 42 වන ඡේදයේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීමක් සිදු කිරීමෙන් තොරව, ගිවිසුමේ ඡේද අංක 5 ට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) විසින් මිලදී ගන්නා ලද විදුලිය සඳහා ගෙවීම් ප්‍රමාද වීම මත 2021 සිට 2023 දක්වා වූ පෙර කාලපරිච්ඡේදය සඳහා වන රු. 40,336,568 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	එකඟ වේ.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ආ)	එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 37 වන ඡේදයට අනුව, දේපළ, පිරියත හා උපකරණ පන්තියක් යනු ආයතනයක මෙහෙයුම්වල සමාන ස්වභාවයේ සහ සමාන භාවිතයෙන් යුත් වත්කම් කාණ්ඩයකි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති පරිදි, බලාගාරයේ වටිනාකම වූ රු. 599,158,493 ක් ගොඩනැගිලිවල ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට ගොඩනැගිල්ලේ වටිනාකම වෙන් කර දැක්වීම සඳහා ගොඩනැගිල්ල සඳහා වෙනම වටිනාකමක් ලබා ගැනීම සඳහා නිසි තක්සේරුවක් සිදු කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. තවද, ඉහත සඳහන් කළ සෑම අයිතමයකම ප්‍රයෝජනවත් ආයු කාලය සමාගම විසින් තක්සේරු කර නොතිබුණි.	එකඟ වේ. තක්සේරු දෙපාර්තමේන්තුව හරහා නිසි තක්සේරුවක් මගින් මෙය සිදු කළ යුතු අතර ඒ සඳහා කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඇ)	පර්චසයකට රු. 5,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් (වත්මන් අනුපාතය රු. 5,750 කි.) යටතේ 2015 පෙබරවාරි 18 වන දින සිට වසර 20 ක කාලයක් සඳහා කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම, හිමිකාරිත්වය දැරීම සහ	එකඟ වේ. ඒ අනුව නිවැරදි කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.

	ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩමක් කල්බදු යටතේ ලබා ගැනීම සඳහා සමාගම විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹ වී තිබුණි. ඒ අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් 16 - කල්බදු ප්‍රමිතයට අනුව ඉඩම භාවිත අයිතිය සතු වත්කමක් සහ කල්බදු වගකීමක් ලෙස හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, සමාගම ඉහත භාවිත අයිතිය සතු වත්කම මෙහෙයුම් කල්බදු ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් 16 - කල්බදු ප්‍රමිතියේ හඳුනාගැනීමේ සහ මිනුම් නිර්ණායකයන්ට අනුකූලව ඉඩම භාවිත අයිතිය සතු වත්කමක් සහ කල්බදු වගකීමක් ලෙස හඳුනාගැනීම වෙනුවට එම කාල සීමාව සඳහා කල්බදු මුදල වූ රු. 4,910,847 ක් ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට අය කර තිබූ අතර උපචිත වියදම්වලට බැර කර තිබුණි.		
	තවද, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 සිට 2024 දක්වා වූ කාලය සඳහා රු. 32,829,237 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. ඒ අනුව, 2024 ඔක්තෝබර් 09 දිනැති ලිපියට අනුව, බලපත්‍රය ඉදිරියේදී අවලංගු කිරීමට නියමිත බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සමාගමට දන්වා තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සමාගම විසින් ඉහත කරුණ හෙළිදරව් කර නොතිබුණි.	පියවීමට ප්‍රමුඛතාවය ලබා දීමට එකඟ වෙමින් සමාගම විසින් පියවිය යුතු නිවැරදි මුදල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. ඒ අනුව අවලංගු කිරීම සිදු නොකරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ (එස්.එල්.ඊ) ඉවතලන ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාගම විසින් 2024 නොවැම්බර් 22 වන දින රු. 14,957,456 ක බැංකු අණකරයක් ලබාගෙන තිබූ අතර එය 2024 දෙසැම්බර් 31 වන දින පියවා තිබුණි. කෙසේ වෙතත්, රු. 1,212,405 ක් වූ අයිරා පහසුකම සඳහා අයකරන ලද මූල්‍ය වියදම් සහ ණයවර ලිපිය	එකඟ වේ. ඒ අනුව නිවැරදි කරනු ඇත.	වැරැද්ද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

සඳහා වන බැංකු ඇපකරය මත කොමිස් එස්.එල්.ඊ වෙතින් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය සහ එස්.එල්.ඊ වෙතින් ලැබිය යුතු මුදල් එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.

1.5.2.3 සීමාසහිත බයෝ-මෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගමේ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 37 වන ඡේදයට අනුව, දේපළ, පිරියත හා උපකරණ පන්තියක් යනු ආයතනයක මෙහෙයුම්වල සමාන ස්වභාවයේ සහ සමාන භාවිතයෙන් යුත් වත්කම් කාණ්ඩයකි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති පරිදි, රු. මිලියන 259 ක් වූ බලාගාරයේ වටිනාකම බලාගාරයේ වටිනාකම සමඟ ඉඩම සහ ගොඩනැගිල්ලේ වටිනාකමින් සමන්විත විය. කෙසේ වෙතත්, එක් එක් වත්කම සඳහා වෙන වෙනම තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව 2024 දෙසැම්බර් 31 වන දිනට සමාගම විසින් ඉඩම හා ගොඩනැගිල්ල සහ බලාගාරය සඳහා වෙන වෙනම වටිනාකම් ගිණුම්ගත කර තිබුණි. එබැවින්, තක්සේරු වාර්තාව නොමැතිකම හේතුවෙන් එක් එක් සංරචකයේ වටිනාකමෙහි නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැකි විය. තවද, ප්‍රමිතියේ 58 වන ඡේදයේ විධිවිධානයට පටහැනිව සමාගම විසින් ඉඩම් වටිනාකම මත ක්ෂය කිරීම ද සිදු කර තිබුණි.	එකඟ වේ. අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිෂ්ඨාව රු. මිලියන 259 ක් වූ අතර එය බලාගාරය, ගොඩනැගිල්ල, ඉඩම, අනෙකුත් අදාළ උපකරණවල වටිනාකම සහ ආරම්භක ස්කන්ධ වටිනාකම ආවරණය කරයි. ඒ අනුව, හිමිකාරිත්වය වෙනස් කිරීම සඳහා ගොනු කරන ලද 15 වන අකෘතිය යටතේ රු. මිලියන 90 ක කොටස් වටිනාකම ශ්‍රී ලංකා එනර්ජීස් හි නමට මාරු කරන ලදි. ඉතිරි ආයෝජනය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යටතේ සම්බන්ධිත පාර්ශවයට ගෙවිය යුතු මුදල ලෙස වාර්තා කළද, ඉතිරිය වර්තමාන මූල්‍ය වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව අදාළ සමාගම් වෙත වටිනාකමට සමානව නිකුත් කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට කොටස් අයදුම්පත් මුදල රු. මිලියන 169 ක් විය. කෙසේ වෙතත්, කොටස් අයදුම්පත් මුදල් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර කොටස්	සම්පූර්ණයෙන්ම එකඟ නොවේ. මෙම විශේෂිත අත්පත් කර ගැනීම සම්පූර්ණයෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සිදු කරන ලදි. මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව ලෙස රු. මිලියන 259 ක වටිනාකම අනුමත කරන ලද	අධ්‍යක්ෂ මණ්ඩල සංදේශය සහ තීරණය වැනි ප්‍රමාණවත් සහ යෝග්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් මුදලේ ශේෂයට අදාළව ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි විගණනයට ලබා දී නොතිබුණි.	අතර ඒ අනුව රු. මිලියන 259 ක් ගෙවීමෙන් අත්පත් කර ගන්නා ලදි. මුළු මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව අතරින් රු. මිලියන 90 ක් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ නමට කොටස් මාරු කිරීම ලෙස ගිණුම්ගත කර ඇති අතර ඉතිරිය කොටස් නිකුත් කරන තෙක් කොටස් අයදුම්පත් මුදල් ලෙස ගිණුම්ගත කර ඇත.

1.5.2.4 සීමාසහිත දැදුරුඔය කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයක් විසින් වැරදි සොයා ගැනීමෙන් පසු නිකුත් කිරීම සඳහා අවසර දී ඇති පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ප්‍රමාණාත්මක පෙර කාල පරිච්ඡේද වැරදි, (අ) වැරැද්ද සිදු වූ පෙර කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක වටිනාකම නැවත ප්‍රකාශ කිරීම; හෝ (ආ) ඉදිරිපත් කරන ලද මුල්ම පෙර කාල පරිච්ඡේදයට පෙර වැරැද්ද සිදු වූයේ නම්, ඉදිරිපත් කරන ලද මුල්ම පෙර කාල පරිච්ඡේදයේ වත්කම්, වගකීම් සහ ස්කන්ධවල ආරම්භක ශේෂයන් නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කළ යුතු බව එල්.කේ.ඒ.එස් 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියේ 42 (ඒ) සහ (බී) ඡේදවල සඳහන් වේ. කෙසේ වෙතත්, එල්.කේ.ඒ.එස් 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියේ 42 වන ඡේදයේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගැලපීම සිදු කිරීමෙන් තොරව ගිවිසුමේ අංක 5.2 (බී) ඡේදයට අනුව 2021 සිට 2023 දක්වා වූ පසුගිය කාල පරිච්ඡේදය සඳහා ලං.වි.ම ගෙවීම් ප්‍රමාද කිරීම මත රු. 37,573,582 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	එකඟ වේ.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.

(ආ)	එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 51 වන ඡේදයට අනුව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම්, එල්.කේ.ඒ.එස් 08 ප්‍රමිතියට අනුව වෙනස්කම් ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට කාණ්ඩ 9 කට අදාළව රු. 273,786,978 ක ධාරණ වටිනාකමක් ඇති වත්කම් ප්‍රමිතියට අනුව සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.	එකඟ වේ.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූල විය යුතුය.
(c)	2021/2022 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තාව අවසන් කර තිබුණද, 2021/2022 වර්ෂය සඳහා රු. 2,731,300 ක ආදායම් බදු අධි වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ෂය සඳහා ලාභය එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂය අවසානයේ ගෙවිය යුතු ආදායම් බද්ද එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	එකඟ වේ.	මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු නිසි ලෙස සටහන් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.2 වගන්තිය	මෙම අත්පොතේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා සමාගමේ බඳවා ගැනීම් වෙනුවෙන් සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) පිළියෙල කර නොතිබුණි.	මෙහෙයුම් අත්පොතක් දැනට නොමැත. හැකි ඉක්මනින් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත.	රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ එම වගන්තියට අනුකූල විය යුතුය.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.2.5 (අ) වගන්තිය	ලාභාංශ, ස්කන්ධය හා කොටස් හිමිකමේ වෙනස්වීම් සහ ප්‍රධාන ගනුදෙනු ඇතුළු ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ උපකාරක ප්‍රතිපත්තියක් තිබීම අනිවාර්ය වේ. කෙසේ වෙතත්, සමාගම එවැනි ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි.	ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ උපලේඛණයක් දැනට නොමැත. හැකි ඉක්මනින් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත.	රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල එම වගන්තියට අනුකූල විය යුතුය.

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.4 වගන්තිය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම II හි දක්වා ඇති ආකෘතිය භාවිතා කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා වෙත වාර්ෂිකව ඔවුන්ගේ සම්බන්ධතාවය තනි තනිව ප්‍රකාශ කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2024 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන ලබාගෙන නොතිබුණි.	අනාගතයේදී සමාගම මෙයට අනුකූල වනු ඇත.	රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල එම වගන්තියට අනුකූල විය යුතුය.
(ඈ) 2021 නොවැම්බර් 16 දිනැති ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය	විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී විගණන කමිටු දෙකක් පමණක් පවත්වා තිබුණි.	විගණන කමිටුවේ සාමාජිකයින් නොමැති වීම හේතුවෙන්, සැලසුම් කළ පරිදි කාර්තුමය රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.	රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 24 දරන දේශීය ආදායම් පනත (i) 90 (1) වගන්තියට අනුව, පනතේ විධිවිධාන මගින් නියම කර ඇති පරිදි, සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් කාර්තුමය ආදායම් බදු වාරික ගෙවා නොතිබුණි. (ii) 126 (1) වගන්තියට අනුව, පනතේ විධිවිධාන මගින් නියම කර ඇති පරිදි, සමාගම විසින් 2017/2018 සහ 2022/2023 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තා ගොනු කර නොතිබුණි.	2022/2023 සහ 2023/2024 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු වාර්තා ගොනු කිරීම් දැනට සිදුකරමින් පවතී. අවශ්‍ය ගණනය කිරීම් සම්පූර්ණ කර විගණන සමාලෝචනය සඳහා ඉදිරිපත් කර ඇත. ගෙවිය යුතු බදු වහාම ක්‍රියාත්මක වන පරිදි පියවනු ඇත.	දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 149.68 ක ලාභයක් වූ (බදු පෙර) අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 230.2 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 80.52 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම අඩුවීම සහ සෘජු ව්‍යාපෘති වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දක්වා ඇත.

ආදායම/වියදම්	2024 රු. මිලියන	2023 රු. මිලියන	වැඩිවීම/(අඩුවීම) රු. මිලියන	ප්‍රතිශතය (%)
ආදායම	783.40	1116.86	(333.50)	(29.86)
විකුණුම් පිරිවැය	597.85	683.24	(85.39)	(12.50)
සෘජු ව්‍යාපෘති වියදම්	4.90	1.25	3.65	292.00
පරිපාලන පිරිවැය	108.24	104.14	4.10	3.93
මූල්‍ය වියදම්	38.18	108.05	(69.87)	(64.66)
මූල්‍ය ආදායම	28.55	9.83	18.72	190.43

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ ප්‍රධාන අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව යොදවා ඇති ප්‍රාග්ධන මත ප්‍රතිලාභය සියයට 28.3 සිට සියයට 15.24 දක්වා අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 38.82 සිට සියයට 23.69 දක්වා අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශුද්ධ ලාභ අනුපාතය සියයට 16.38 සිට සියයට 13.85 දක්වා අඩු වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය වාර 0.75 සිට වාර 0.60 දක්වා අඩු වී තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ක්ෂණික අනුපාතය වාර 0.65 සිට වාර 0.47 දක්වා අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාගම ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලිබල (පුද්ගලික) සමාගමට මීටර ආවරණ නිෂ්පාදනය කර සැපයීමේ ව්‍යාපාරයක නිරත වී තිබුණි. කෙසේ වෙතත්, පාර්ශව දෙක අතර කිසිදු ව්‍යාපාරික ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි.	ගිවිසුම එස්.එල්.ඊ හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කර අනුමත කරන ලද අතර තවදුරටත් ඉදිරි කටයුතු සඳහා ලං.වි.ම වෙත ඉදිරිපත් කරන ලදි.	ගිවිසුම ඉක්මනින් අවසන් කළ යුතුය.
(ආ) සමාගම විසින් ලං.වි.ම වෙතින් එකතු කරන ලද සුන්බුන් ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ සහ ඇලුමිනියම් Redraw Rods ලං.වි.ම වෙත විකිණීමේ ව්‍යාපාරයේ නියැලී සිටියද, විගණිත දිනය දක්වාම එම ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පාර්ශව දෙක අතර කිසිදු ව්‍යාපාරික ගිවිසුමක්, ආපසු මිලදී ගැනීමේ ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි.	ගිවිසුම සකස් කර ශ්‍රී ලංකා එනර්ජීස් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඉදිරි කටයුතු සඳහා ලං.වි.ම වෙත ඉදිරිපත් කර ඇත.	ගිවිසුම ඉක්මනින් අවසන් කළ යුතුය.
(ඇ) 2024 ජනවාරි 02 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සම්මත කරන ලද යෝජනාවට අනුව, යන්ත්‍රෝපකරණ උපකරණ ආනයනය කිරීම සඳහා ඉඩම උකසක් ලෙස තබමින් ණයවර ලිපි පහසුකම යටතේ ඉතිරි වටිනාකම වන එ.ජ.ඩො 315,199.20 ක් (ආසන්න වශයෙන් රු. මිලියන 94 ක්) සඳහා ණයවර ලිපියක් විවෘත කිරීමට ශ්‍රී ලංකා එනර්ජීස් විසින් තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2024 වසර අවසන් වන විටත් ව්‍යාපෘති භූමියේ ඉඩම සඳහා නීත්‍යානුකූල නිෂ්කාශනය අදාළ බලධාරීන්ගෙන් ලබාගෙන නොතිබූ බැවින් කර්මාන්තශාලා මෙහෙයුම් සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය කළ නොහැකි බව නිරීක්ෂණය විය.	එකඟ වේ. ඉඩම් නිදහස් කිරීමේ ගිවිසුම 2025 ජූලි 17 වන දින අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කරන ලද අතර පසුව ඉදිරි කටයුතු සඳහා ජනාධිපති කාර්යාලයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉඩම් නිදහස් කිරීම අවසන් වනු ඇතැයි දැන් අපේක්ෂා කෙරේ.	ව්‍යාපෘති භූමියේ ඉඩම සඳහා අදාළ බලධාරීන්ගෙන් නීත්‍යානුකූල නිෂ්කාශනය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(ඈ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයට (ලං.වි.ම) ගෙවිය යුතු මුදල් ශේෂය රු. 25,848,726 ක් විය. කෙසේ වෙතත්, ලං.වි.ම හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූපී අනෙකුත් ලැබිය යුතු ශේෂය රු. 28,290,000 ක් වූ අතර රු. 2,441,274 ක වෙනසක් නිරීක්ෂණය විය.	ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු දැනටමත් ලං.වි.ම සමඟ බෙදාගෙන ඇති අතර සැසඳීම ද සම්පූර්ණ කරනු ඇත.	දෙපාර්ශවය අතර ඇති වෙනස්කම් සසඳා, හැකි ඉක්මනින් හිඟ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ) සමාගමේ සාමාන්‍යාධිකාරී වෙත ලං.වි.ම විසින් ගෙවන ලද රු. 21,966,396 ක වැටුප් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ගෙවා නොතිබුණි.	ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු දැනටමත් ලං.වි.ම සමඟ බෙදාගෙන ඇති අතර සැසඳීම ද සම්පූර්ණ කරනු ඇත. තවද, ශ්‍රී ලංකා එනර්ජීස් හි සාමාන්‍යාධිකාරීගේ වැටුප්වලට අදාළ ගෙවිය යුතු ශේෂයෙන්, රු. 8,339,763.67 ක් පසුගිය මාස හය සඳහා වේ.	ගෙවිය යුතු ශේෂයන් පියවීමට කටයුතු කළ යුතුය.
(ඊ) 2025 මාර්තු 18 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සෘජුවම ලබාගත් තොරතුරුවලට අනුව, 2015 තුන්වන කාර්තුව සඳහා ගෙවිය යුතු වැට් බදු රු. 1,596,821 ක් විය. කෙසේ වෙතත්, 2025 ජුනි 26 වන දිනැති විගණිත දිනය දක්වා ඉහත මුදල පියවීමට සමාගම කටයුතු කර නොතිබුණි.	මෙය කලින් දැනුම් දී නොමැත. ඒ පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ පසුවිපරම් කරනු ඇත.	ගෙවිය යුතු වැට් බදු පියවීමට කටයුතු කළ යුතුය.
(උ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ශේෂය වූ රු.1,089,334 ක් වසර 06 කට වැඩි කාලයක සිට පියවීමකින් තොරව පැවතුනි.	SSCL සඳහා පමණක් වෙනම ගිණුමක් තිබීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන නොමැති අතර එමෙන්ම NBT දැන් ක්‍රියාත්මක නොවේ. ගිණුමේ නම "NBT/SSCL" ලෙස වෙනස් කරන ලද අතර එය NBT හි දිගුකාලීන හිඟ ශේෂය සහ SSCL හි වර්තමාන යාවත්කාලීන ශේෂයෙන් සමන්විත වේ. හිඟ වැට් බදු	හිඟ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	පියවීමට ප්‍රමුඛතාවය දී ඇති අතර මෙම හිඟ NBT ශේෂය ඒ අනුව පියවනු ඇත.	
(ඌ) 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු SSCL ශේෂය (ශුද්ධ) රු.8,951,263 ක් විය. තවද, මෙයට 2020 සිට පවතින රු.494,298 ක ලැබිය යුතු NBT ශේෂය ඇතුළත් වේ.	එකඟ නොවේ. ලැබිය යුතු NBT ශේෂය වෙනම හඳුනාගෙන ඇති අතර එය ලං.වි.ම වෙතින් ලැබිය යුතුය. විස්තර විගණනයට ඉදිරිපත් කර ඇත.	හිඟ ශේෂයන් පියවීමට කටයුතු කළ යුතුය.
(එ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, රු. 97,503,731 ක ගෙවිය යුතු ආදායම් බදු වසර 07 කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි.	කරුණාකර 1.2.1.2 (ඕ) හි විගණන විමසුමටම ලබා දුන් පිළිතුර පරිශීලනය කරන්න.	හිඟ ශේෂයන් පියවීමට කටයුතු කළ යුතුය.

3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
විදුලිබල මණ්ඩලය විසින් සීතාවක ගඟ ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මුලින් ජල විදුලි මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන තිබූ අතර ඔවුන් 2015 සිට 2021 දක්වා මෙම ව්‍යාපෘතියේ නියැලී සිටි අතර ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 301 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය දුෂ්කරතා සහ රජයේ ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුවෙන්, 2021 දී ලං.වි.ම විසින් ව්‍යාපෘතිය ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමට පවරා තිබුණි. ඒ අනුව, සමාගම මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබූ අතර, මෙගාවොට් 7 බැගින් වූ ජල විදුලි බලාගාර 2 ක් රු. මිලියන 3,500 ක වියදමින් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ මූලික කටයුතු 2021 දී සමාගම විසින් ආරම්භ කර තිබූ අතර 2024 අප්‍රේල් 01 වන දින මුල්ගල් තබා තිබුණි. ලං.වි.ම විසින් කරන ලද වියදමට අමතරව, 2024 දෙසැම්බර් 31 වන විට සමාගම මෙම ව්‍යාපෘතිය සඳහා රු. 18,830,072 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත්, ජාතික විදුලිබල පද්ධතියට අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීමෙන් තොරව ව්‍යාපෘති ඉදිකිරීම් තවමත් ආරම්භක අදියරේ පැවතුනි.	අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා වත්මන් තත්ත්වය පහත පරිදි වේ. මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලද පසු, සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම ලං.වි.ම සමඟ ක්‍රියාවට නැංවිය හැකිය. මධ්‍යම පරිසර අධිකාරිය හැර අනෙකුත් සියලුම අනුමැතීන් අදාළ ආයතනවලින් ලබාගෙන කෙටුම්පත් කරන ලද අයි.ඊ.ඊ වාර්තාවක් අධිකාරියට ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් අපේක්ෂාවෙන් සිටී.	අදාළ නිෂ්කාශණයන් පසු විපරම් කර ව්‍යාපෘතිය කඩිනම් කිරීමට.කටයුතු කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත 2023 නොවැම්බර් 24 වන දින සමාගම විසින් හේලීස් ඇවෙන්චුරා ප්‍රයිවට් ලිමිටඩ් සමඟ මෙට්‍රික් ටොන් එකක් එ.ජ.ඩො 3860 බැගින් පොලිකාබනේට් මෙට්‍රික් ටොන් 360 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) ඡේදවලට අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (එම්.පී.පී) සකස් කළ යුතු අතර, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂා කරන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් එම්.පී.පී හි ලැයිස්තුගත කළ යුතුය. ඊළඟ වසර සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විස්තරාත්මකව සකස් කළ යුතුය. කෙසේ වෙතත්, විගණිත දිනය වන විටත් සමාගම විසින් එම්.පී.පී සකස් කර නොතිබුණි. (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.2 ඡේදය අනුව, ප්‍රසම්පාදන කාලසටහන සමාගම විසින් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, විගණිත දිනය වන විටත් සමාගම විසින් **ප්‍රසම්පාදන කාලසටහන** සකස් කර නොතිබුණි.	i, ii. සමාගමේ ප්‍රධාන ප්‍රසම්පාදනය මීටර ආවරණ නිෂ්පාදන කම්හල සඳහා පහත සඳහන් අයිතම ප්‍රසම්පාදනයට සම්බන්ධ වේ. 1. පොලිකාබනේට් 2. මීටර්බැච් 3. රැලි සහිත කාඩ්බෝඩ් පෙට්ටි 4. රබර් බීඩින් 5. ටොරිසන් ස්ප්‍රින්ග්ස් වර්තමාන සන්දර්භය තුළ, ඉහත ද්‍රව්‍ය අවශ්‍යතා තරඟකාරී ටෙන්ඩර් ක්‍රියාදාමයන් යටතේ ප්‍රසම්පාදනය කරනු ලබන අතර සාමාන්‍යයෙන් එක් එක් අයිතමය සඳහා ටෙන්ඩර් කිරීම, නිෂ්පාදන සැලැස්ම මත පදනම් වූ වාර්ෂික අවශ්‍යතාවය සපුරාලීම සඳහා වේ. ඒ අනුව, ද්‍රව්‍ය අවම ඇණවුම් මට්ටමට ළඟා වූ පසු සහ කම්හල් කළමනාකරුගේ ඉල්ලීම පරිදි, ටෙන්ඩරය ප්‍රකාශයට පත් කරයි. ඉහත ක්‍රියා පටිපාටිය හැරුණු විට කිසිදු ව්‍යුහගත ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සමාගම සතු නොවන අතර ඉක්මනින්ම සකස් කිරීමට අනුගත වනු ඇත.	මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.3.1 ඡේදයට අනුව, අදාළ සියලු වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (ටී.ඊ.සී) ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර නොතිබුණි.	පිළිගත නොහැක. සෑම ප්‍රසම්පාදනයක් සඳහාම මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කර ඇත. කරුණාකර ටෙන්ඩර්වල ටී.ඊ.සී වාර්තා පරිශීලනය කරන්න.	මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය.
(iv) ප්‍රසම්පාදන අත්පොතේ 2.12 ඡේදයට අනුව, ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සියලුම සාමාජිකයින් එහි පළමු රැස්වීමේදී නියමිත ආකෘතියෙන් ප්‍රකාශනයට අත්සන් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් විසින් ප්‍රකාශන ආකෘති පත්‍ර අත්සන් කර නොතිබුණි.	මෙම හොඳම පරිචය අනුගමනය කරනු ඇත.	මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (එස්.ඩී.ජී) පිළිබඳ "2030 න්‍යාය පත්‍රයට" අනුකූලව, සියලුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ අරමුණු සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී දායක විය යුතුය. නමුත්, සමාගම විසින් සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම අරමුණු සපුරා ගැනීමේ පරතරය සහ ප්‍රගතිය මැනීම සඳහා සුදුසු දර්ශකයද හඳුනාගෙන නොතිබුණි.	මෙම හොඳම පරිචය අනුගමනය කරනු ඇත.	සමාගම තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" හැකිතාක් අනුකූල විය යුතුය.